Library
54233
සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**
21 - 11 - 2016

Resource Center
De Mazenod College
Kandana

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:
- දී ඇති උපදෙස් පිළිපදිමින් පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුර අතුරින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සෞරග්‍රහ මණ්ඩලයේ සූර්යයාට වඩාත් ඈතින්ම පිහිටි ග්‍රහලෝකය කුමක් ද?
(1) බුධ (2) නෙප්චූන් (3) අඟහරු (4) යුරේනස්

(02) මිනිස් කටයුතු කෙරේ බලපාන සියලුම වායුගෝලීය සිද්ධි හා සම්බන්ධ වැදගත්ම කලාපය වන්නේ කුමක් ද?
(1) පරිවර්තී ගෝලය (2) ශිලාගෝලය
(3) ජෛවගෝලය (4) අපරිවර්තී ගෝලය

(03) යුරෝපය හා ආසියා මහාද්වීපය වෙන්කරන කඳුවැටිය වන්නේ,
(1) වින්ධ්‍යා (2) හිමාලය (3) හින්දු කුෂ් (4) යූරල්

(04) සින්දු ගංගාවේ පිහිටි අතු ගංගාවක් වන්නේ මින් කුමක් ද?
(1) තුංග භද්‍ර (2) ජේලම් (3) බ්‍රහ්ම පුත්‍ර (4) මහානදී

(05) 1 : 50,000 භූ ලක්ෂණ සිතියම් වල සමෝච්ච රේඛා අන්තරය කොපමණ ද?
(1) 20m කි (2) 30m කි. (3) 40m කි. (4) 100m කි.

- අංක 06 සිට 10 දක්වා වගන්තිවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.

(උත්තල බෑවුම, බංග්ලාදේශය, ඉන්දියන් සාගරය, මඳ බෑවුම, සෙනසුරු, පැසිපික් සාගරය, පාකිස්ථානය, බ්‍රහස්පති)

(06) පෘථිවිය මත ඇති විශාලතම සාගරය ........................................ යි.

(07) කඳු මුදුනේ සිට පහත් බිම් දෙසට ක්‍රමවත්ව බෑවුම අඩුනම් එය ........................................ කි.

(08) දකුණු ආසියාවේ සෙසු රටවලට සාපේක්ෂව ස්වාභාවික සම්පත් අඩු රටක් ලෙස ........................................ වැදගත් වේ.

(09) හණ කර්මාන්තය ප්‍රධාන ආදායම් මාර්ගයක් වන දකුණු ආසියාතික රට වන්නේ ........................................ යි.

(10) සෞරග්‍රහ මණ්ඩලයේ විශාලතම ග්‍රහලෝකය ........................................ ය.

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(11) පෘථිවිය බටහිර සිට නැගෙනහිරට භ්‍රමණය වන නිසා ........................................ දේශාංශවල පිහිටි රටවලට කලින් හිරු උදාවේ.

(12) ග්‍රිනිච් වේලාව දහවල් දොළහ වනවිට නැගෙනහිර දේශාංශ $15^{\circ}$ වේලාව පස්වරු .......................... වෙයි.

(13) සූර්යයා වටා පෘථිවිය ........................................ වන නිසා ඍතුභේදය ඇති වේ.

(14) දකුණු ආසියානු කලාපීය රටවල සමාජ ආර්ථික දේශපාලනික සහයෝගීතාව සඳහා .............................. සංවිධානය පිහිටුවාගෙන තිබේ.

(15) ඩ්‍රැකන්ස්බර්ග් කඳු වැටිය ........................................ මහාද්වීපයට අයත් වේ.

- අංක 16 සිට 20 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.

(16) සුන්දර බාන්ස් තැන්න, පාමීර් සානුව දකුණු ආසියාවට අයත් වේ. (නි / වැ)

(17) පරිවර්ථී ගෝලය තුළ ඕසෝන් වියන පිහිටා ඇත. (නි / වැ)

(18) 1 : 50,000 සිතියම්වල පරිමාණය වාචිකව ද දක්වයි. (නි / වැ)

(19) රටක දළ ජාතික ආදායම එරට මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් බෙදීමෙන් ඒක පුද්ගල ආදායම ගණනය කළ හැකිය. (නි / වැ)

(20) රටවැසියෙකු යම්කිසි රැකියාවක නිරතවීම සේවා වියුක්තිය යි. (නි / වැ)

(ලකුණු 2 X 20 = 40)

## <u>II කොටස</u>

- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) තුන්වන වාරය සඳහා නියමිත පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාකාරකම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) බිත්ති පුවත්පත සඳහා තොරතුරු රැස්කිරීමට ඔබේ කණ්ඩායමට ලබාදුන් මාතෘකාව සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාවට තොරතුරු ලබාගත් මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) මෙම ක්‍රියාකාරකමෙහි යෙදීම නිසා ඔබට තොරතුරු දැනගැනීමට හැකිවූ ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) ඔබේ කණ්ඩායමට ලැබුණු මාතෘකාවට අදාල තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(v) ක්‍රියාකාරකම සඳහා ඔබ කණ්ඩායමට ලකුණු ලබාදුන් නිර්ණායක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(vi) මෙම ක්‍රියාකාරකමේ දී ඔබ මුහුණදුන් ගැටලු දෙකක් දක්වන්න. (ලකුණු 02)

(vii) එම ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ඔබේ කණ්ඩායම අනුගමනය කළ ක්‍රියාමාර්ග එකක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(02) (i) සෞරග්‍රහ මණ්ඩලයේ උදා තරුව හා රතු ග්‍රහයා නමින් හඳුන්වන ග්‍රහලෝක දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii) ''පෘථිවි ව්‍යූහය පිළිබඳව සලකා බැලීමේ දී ප්‍රධාන ගෝල හතරකින් යුක්තය'' ඒවා නම් කරන්න. (ලකුණු 04)

(iii) ''පෘථිවි පෘෂ්ඨයට ආසන්නව ඇත්තේ 'පරිවර්ති ගෝලයයි' ඒ තුළ සිදුවන සංසිද්ධීන් තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) දකුණු ආසියානු කලාපයට අයත් පකිස්ථානය හා භූතානයේ අගනුවරවල් පිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත වරහන තුළ දක්වා ඇත්තේ දකුණු ආසියානු කලාපයට අයත් කඳු හා ගංගා කිහිපයකි. ඉන්දියාවට අයත් කඳුවැටි දෙකක් හා ගංගා දෙකක් තෝරා ලියන්න.
(හින්දු කුෂ්, කාරකෝරම්, වින්ධ්‍යා, බ්‍රහ්ම පුත්‍ර, නර්මදා, සින්දු, සුලෙයිමන්) (ලකුණු 04)

(iii) දකුණු ආසියානු කලාපයේ දේශගුණ විවිධත්වය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශවල බලශක්තිය නිපදවාගැනීමට යොදා ගන්නා කෘෂිකර්මයෙන් ඉවතලන ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව බලශක්තිය ලබා ගැනීමේ දී මුහුණපා ඇති දුෂ්කරතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ඉන්දීය ග්‍රාමීය ජනතාවගේ ජන ජීවිතය යහපත් කර ගැනීමට බලශක්ති සම්පත යොදවාගෙන ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) දකුණු ආසියාවේ රටවල් අතරින්,
A අඩුම ඒක පුද්ගල ආදායම ලබන රට,
B වැඩිම ඒක පුද්ගල ආදායම ලබන රට, නම් කරන්න. (ලකුණු 02)

(ii) රටක වැසියන් සේවයේ නිරතව සිටින ප්‍රධාන අංශ තුනකි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඒක පුද්ගල ආදායම වැඩිවීම නිසා රටක් තුල දැකිය හැකි ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) හිමාලයේ වාසය කරන ගෝත්‍රික කණ්ඩායම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) හිමාලයේ කඳුකර ජනතාවගේ ශරීර අවයව පරිසරයට හා දේශගුණයට අනුව සකස් වී ඇති ආකාර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) නේපාලයේ ගෝත්‍රික ජනතාවගේ ජීවිතවලට බලපා තිබෙන ගැටලු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) ඉන්දියාවේ බහුල ලෙස යපස් නිධි පිහිටි ප්‍රදේශ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) යපස් කැනීමේ කර්මාන්තය නිසා එම ප්‍රදේශවල ඇති වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ඉන්දියාවේ යපස් කැනීමේ කර්මාන්තය නිසා ජන ජීවිතයට ඇති වූ අහිතකර බලපෑම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)